**විසර්ජන ශීර්ෂ 160 පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව -2012 වර්ෂය**

මෙම වාර්තාව කොටස් දෙකකින් සමන්විත වේ.

1. කොටස - අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු වල ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව.
2. කොටස - එක් එක් විසර්ජන ශීර්ෂයන්ට අදාල විස්තරාත්මක වාර්තාව.

I කොටස

<u>පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවේ ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව.</u>

**01. අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුව.**

| වැය ශීර්ෂය | දෙපාර්තමේන්තුවේ නම |
|---|---|
| 283 | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව |

**02. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම්**

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුව සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.3,472,106,000 ක් වී තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.2,284,597,540 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තුවේ ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම පිළිවෙලින් රු.1,110,883,550 ක් හා රු.76,624,910 ක් හෙවත් මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 50.3ක් හා සියයට 6.05 ක් වීතිබුණි. විස්තර පහත දැක්වේ.

| විසර්ජන ශීර්ෂය | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | 2012 දෙසැම්බර් 31 දිනට ශුද්ධ ප්‍රතිපාදනය | | 2012 දෙසැම්බර් 31 දිනට උපයෝජනය | | 2012 දෙසැම්බර් 31 දිනට ඉතිරිය | |
|---|---|---|---|---|---|---|---|
| | | පුනරාවර්තන | මූලධන | පුනරාවර්තන | මූලධන | පුනරාවර්තන | මූලධන |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 160 | පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය | 566,091,000 | 1,640,065,000 | 514,998,996 | 580,273,454 | 51,092,004 | 1,059,791,546 |
| 283 | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 852,700,000 | 413,250,000 | 814,409,854 | 374,915,236 | 38,290,146 | 38,334,764 |
| | එකතුව | 1,418,791,000 | 2,053,315,000 | 1,329,408,850 | 955,188,690 | 89,382,150 | 1,098,126,310 |

## 2.2 ආදායම් ගිණුම්

### (ආ) ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් 2012 වර්ෂයේදී ආදායම් සංකේත දෙකක් සඳහා රු.1,025,000,000 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර, රු.817,802,166 ක ආදායමක් රැස්කර තිබුණි. ඒ අනුව ඇස්තමේන්තු ගත ආදායමෙන් සියයට 79.8 ක රැස්කර ගෙන තිබුණි. විස්තර පහත දැක්වේ.

| ආදායම් ගණන් දීමේ නිලධාරි | ආදායම් සංකේතය | ඇස්තමේන්තුගත | තථ්‍ය | (අඩුවෙන් එකතුකිරීම)/ වැඩියෙන් එකතු කිරීම | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | % |
| වන සංරක්ෂණ ජනරාල් | 1003:07.03 | 150,000,000 | 59,386,598 | (90,613,402) | 60.4 |
| වන සංරක්ෂණ ජනරාල් | 2002:01.02 | 875,000,000 | 758,415,568 | (116,584,432) | 13.3 |

## 2.3 අත්තිකාරම් ගිණුම්

### 2.3.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවක් වෙත රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව පනවා තිබුණු පහත සඳහන් සීමාවන් පිළිපැද තිබුණි.

| ශීර්ෂය | විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂ | |
|---|---|---|---|---|---|---|---|
| | | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 160 | 16001 | 11,000,000 | 8,810,052 | 5,500,000 | 11,091,435 | 50,000,000 | 27,062,765 |
| 283 | 28301 | 75,000,000 | 52,584,305 | 45,000,000 | 63,668,129 | 298,500,000 | 241,809,722 |

## 2.4 අග්‍රිම හා පොදු තැන්පත් ගිණුම්

### 2.4.1 අග්‍රිම ගිණුම්

අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තමේන්තුවේ 2012 දෙසැම්බර් 31 දින වන විට අග්‍රිම ගිණුම්වල රු.25,229,756 ක් වූ හර ශේෂ පැවතුණි. විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය හර/(බැර) |
|---|---|
| | රු. |
| පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය | 260,361 |
| වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 24,969,395 |
| | 25,229,756 |

### 2.4.2 පොදු තැන්පත් ගිණුම

2012 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයෙ හා දෙපාර්තමේන්තුවේ පොදු තැන්පත් ගිණුමේ ශේෂ එකතුව රු. 24,894,497 ක් වූ අතර ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ගිණුම් අංකය | 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු. |
| පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය | 6000/000/00/0015/0070 | 12,611,878 |
| වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 6000/000/00/0015/0138 | 12,282,619 |
| එකතුව | | 24,894,497 |

02 කොටස

**එක් එක් විසර්ජන ශීර්ෂයන්ට අදාල විස්තරාත්මක වාර්තාව**

## 01. විසර්ජන ශීර්ෂය 160 - පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය

### 1.1 විගණන විෂය පථය

පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශ, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 අගෝස්තු 30 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනදෙනු වල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකතාක් පුළුල් විගණනයක් කළහැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්තික සමාජවාදි ජනරජයෙ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150, හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 1.3 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ පිළිබඳ විගණන නිරීක්ෂණය

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ, මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ 1.4සට 1.11 දක්වා වූ ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයාගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

(අ) අයවැය විචලනය

(i) වැය විෂයයන් 11 ක් සඳහා සළසා තිබූ රු.299,300,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ii) වැය විෂයයන් 21 ක් සඳහා රු. 6,248,150,000 ක අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් එම ප්‍රතිපාදන උපයොජනය කිරීමෙන් පසු රු. 458,324,587 ක ඉතිරියක් විය. එය වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 50 ත් සියයට 97 ත් අතර පරාසයක පැවතුණි.

(iii) ක්‍රියාකාර සැලැස්ම තුළ ඇතුළත් ව වායු තත්ත්ව කළමනාකරණ හා ජාත්‍යාන්තර සම්බන්ධතා අංශයේ ක්‍රියාකාරකම් 08 ක් සඳහා සළසා තිබුණු රු.4,280,000 ක් වූ ප්‍රතිපාදනය රු.4,764,500 කින් ද, ජෛව විවිධත්ත්ව අංශයේ ක්‍රියාකාරකම් 03 ක් සඳහා සළසා තිබුණු රු.490,000 ක් වූ ප්‍රතිපාදනය රු.391,310 කින් ද, දේශගුණික විපර්යාස අංශයේ ක්‍රියාකාරකම් 07 ක් සඳහා සළසා තිබුණු රු.47,320,000 ක් වූ ප්‍රතිපාදනය රු.5,373,890 කින් ද, තිරසර සංවර්ධන අංශයේ ක්‍රියාකාරකම් 03 ක් සඳහා සළසා තිබුණු රු.750,000 ක් වූ ප්‍රතිපාදනය රු.3,975,330 කින්ද ඉක්මවා උපයෝජනය කර තිබුණි.

(ආ) අග්‍රිම ගණුම

2007 වර්ෂයේ සිට පැවත එන රු.260,361 ක අග්‍රිම ශේෂය 2013 අප්‍රේල් 30 දින වන විටත් නිරවුල් කර නොතිබුණි.

(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශ

විෂය අංක 16001 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2012 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීමට තිබුණු ශේෂවල එකතුව රු.379,660 ක් වූ අතර, එම හිඟ හිටි ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

## 1.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 1.4.1 සංයුක්ත සැලැස්ම

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානින්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානින් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ් /ආර්/ 2 /2/3/5 (4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් අමාත්‍යාංශය විසින් වර්ෂය ආරම්භයේදී පිළියෙල කළ යුතු වුවත්, එම සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 1.4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කළ යුතු වුවද, චක්‍රලේඛයේ ආකෘතිය ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

### 1.4.3 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන ඒකකය ප්‍රධාන අභ්‍යන්තර විගණක ඇතුළු නිලධාරීන් 05 දෙනෙකුගෙන් සමන්විත වන අතර, 2012 වර්ෂයේදී අභ්‍යන්තර විගණන වාර්තා 10 ක් නිකුත් කර තිබුණි. තවද 2012 වර්ෂයේ අභ්‍යන්තර විගණන වැඩසටහන අනුව, අමාත්‍යාංශයට අයත් පහත සඳහන් ආයතනවල විගණන කාර්යයන් ඇතුළත් කර තිබු නමුත් වර්ෂය තුළ එම ආයතනවල විගණන කටයුතු සිදුකර නොතිබු බව නිරීක්ෂණය විය.

(අ) රාජ්‍ය දැව සංස්ථාව

(ආ) මධ්‍යම පරිසර අධිකාරිය

(ඇ) පිළිසරු ව්‍යාපෘතිය

(ඇ) භූවිද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය.

## 1.5 වත්කම් කළමනාකරණය

### (අ) නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

අමාත්‍යාංශය සතු වාහන 04 ක් 2012 දෙසැම්බර් 31 දින වන විට මාස 03 සිට මාස 21 දක්වා වූ කාල පරාසයක් තුළ නිශ්ක්‍රියව පවතින බව නිරීක්ෂණය විය.

### (ආ) බාහිර පාර්ශවයන් වෙත ලබාදී තිබුණු වත්කම්

අමාත්‍යාංශය විසින් වාහන 04 ක් අවිධිමත් ලෙස බාහිර පාර්ශවයන් වෙත මුදා හැර තිබුණු බව නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| | වත්කම් වර්ගය | වත්කම් සංඛ්‍යාව | වත්කම් ලබාදී ඇති ආයතනය | වටිනාකම<br>රු. |
|---|---|---|---|---|
| (i) | ඉසුසු ඩබල් කැබ් රථ. | 02 | පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය | සඳහන්ව නැත |
| (ii) | ටොයොටා ඩබල් කැබ්රථ. | 02 | ආගමික කටයුතු හා සදාචාර ධර්ම අමාත්‍යාංශය | සඳහන්ව නැත |

### (ඇ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම

වෙනත් ආයතන සතු වාහන 02 ක් විධිමත් අනුමැතියකින් තොරව අමාත්‍යාංශය විසින් භාවිතයට ගෙන තිබුණු අවස්ථා නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| | වත්කම් වර්ගය | වත්කම අයත්ව තිබූ ආයතනය | වටිනාකම<br>රු. |
|---|---|---|---|
| (i) | පර්ජෝ කාර් රථය | රාජ්‍ය දැව සංස්ථාව | ඉදිරිපත් කර නැත. |

(ii) සුභාරූ ජීප් රථය වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව ඉදිරිපත් කර නැත.

## 1.6 අනුකූල නොවීම්

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම්**

මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව අලාභ හානි සඳහා වගකිව යුත්තන් නිශ්චය කළ යුතු වුවද වාහන 03 කට අදාලව සිදුවී තිබුණු රු.629,978 ක් වූ අලාභය සඳහා වගකිවයුතු නිලධාරීන් නිශ්චය කර නොතිබුණි.

## 1.7 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

**ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

අමාත්‍යාංශය විසින් පහත සඳහන් ව්‍යාපෘතිය ඉටුකිරීමේ ප්‍රමාදයක් නිරීක්ෂණය විය.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ කළ දිනය | නිම කළ යුතු දිනය | 2012 දෙසැම්බර් 31 දින වන විට වියදම | ප්‍රමාදයට හේතුව |
|---|---|---|---|---|---|
| | රු. | | | රු. | |
| පන්නල ආදර්ශ නගරය පිහිටුවීම | 10,000,000 | 2011.10.12 | 2012.02.12 | 11,689,995 | සාමාන්‍ය ක්‍රිඩා පිටියක් ලෙස සංවර්ධනය කිරීමට සැලසුම්කර තිබුණද පසුව ක්‍රිකට් ක්‍රිඩාවට සුදුසු ක්‍රිඩාංගනයක් ලෙස සංවර්ධනය කිරීමට යෝජනා වීම. |

## 1.8 කාර්යසාධනය

2012 වර්ෂයේ ක්‍රියාකාර සැලසුමට අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

### (අ) ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්

(i) අමාත්‍යාංශය ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටු නොකර තිබුණු අතර එසේ නිරීක්ෂණය වු අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

| ව්‍යාපෘතියේ නම | ප්‍රතිපාදන මුදල | තථ්‍ය වියදම | නිරීක්ෂණ |
|---|---|---|---|
| | රු. | රු. | |
| වායු තත්ත්ව කළමනාකරණ හා ජාත්‍යන්තර සම්බන්ධතා අංශය | 51,500,000 | 15,085,200 | ක්‍රියාකාර සැලැස්ම තුළ ඇතුළත් ක්‍රියාකාරකම් 64 ක් සඳහා රු. 51,500,000 ක ප්‍රතිපාදන සළසා තිබූ අතර එයින් ක්‍රියාකාරකම් 22 ක සඳහා සළසා තිබූ රු.17,985,100 ක් වූ මුළු ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි. |
| තිරසර පරිසර අංශය | 52,000,000 | 2,399,000 | • හරිත කවය හා පරිසර ගම්මාන වැඩසටහන් ක්‍රියාකාර සැලැස්මට ඇතුළත් කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී ඒ සඳහා රු.19,000,000 ක ප්‍රතිපාදන සලසා තිබූ අතර එම ක්‍රියාකාරකම් සඳහා කිසිදු වියදමක් කර නොතිබුණු අතර ඉන් බැහැර ක්‍රියාකාරකම් සඳහා රු.16,405,000ක් වැය කර තිබුණි. |
| | | | • පවිත්‍ර නගර වැඩසටහන යටතේ වු ක්‍රියාකාරකම් 07 න් 06 කට සලසා තිබූ ප්‍රතිපාදනයෙන් සියයට 90 සිට සියයට 100 දක්වා ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි. |
| ජෛව විවිධත්ව | 32,200,000 | 8,458,550 | • ක්‍රියාකාරකම් 84 ක් සඳහා රු.32,200,000 ක |

| | | | |
|---|---|---|---|
| අංශය | | | ප්‍රතිපාදන සළසා තිබුණත් ඉන් ක්‍රියාකාරකම් 20 ක වෙනුවෙන් සළසා තිබුණු මුළු ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.<br>• ක්‍රියාකාර් සැලැස්ම තුළ ඇතුළත් වූ වැඩසටහන් 04 ක ප්‍රගතිය ඉදිරිපත් කර නොතිබුණි. |
| දේශගුණික විපර්යාස අංශය | 49,715,000 | 31,164,947 | ක්‍රියාකාරකම් 60 ක් සඳහා මෙම ප්‍රතිපාදන සළසා තිබූ අතර, ක්‍රියාකාරකම් 20 ක සඳහා සළසා තිබුණු රු.7,312,000 ක මුළු ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි. |
| තිරසර සංවර්ධන අංශය | 12,900,000 | 6,615,190 | ක්‍රියාකාරකම් 09 ක් වෙනුවෙන් සළසා තිබුණු රු.2,530,000 ක මුළු ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි. |
| ස්වභාවික සම්පත් අංශය | 1,000,000 | 495,000 | ක්‍රියාකාර් සැලැස්ම තුළ ඇතුළත් ක්‍රියාකාරකම් 02 ක් වෙනුවෙන් සළසා තිබුණු ප්‍රතිපාදන මුදල ඉතිරිවී තිබුණි. |

(ii) ක්‍රියාකාර් සැලැස්මට ඇතුළත් ක්‍රියාකාරකම්වල වගකීම් පවරන ලද නිලධාරීන් නම්කර නොතිබුණි.

**(ආ) සැලසුම් කිරීම**

පහත සඳහන් අවස්ථාවලදී ක්‍රියාකාර් සැලැස්මට අනුකූලව ක්‍රියා කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

| | |
|---|---|
| වායු තත්ත්ව කළමනාකරණ හා ජාත්‍යන්තර සම්බන්ධතා අංශය | ක්‍රියාකාර් සැලැස්මට ඇතුළත් නොවූ ක්‍රියාකාරකමක් සඳහා රු. 971,650 ක් වියදම් කර තිබුණි. |
| ජෛව විවිධත්ව අංශය | ක්‍රියාකාර් සැලැස්මට ඇතුළත් නොවූ ක්‍රියාකාරකම් 13 ක් සඳහා රු. 2,230,750 ක් වියදම් කර තිබුණි. |

| | |
|---|---|
| ස්වභාවික සම්පත් අංශය | ක්‍රියාකාර සැලැස්මට ඇතුළත් නොවු ක්‍රියාකාරකමක් සඳහා රු. 495,000 ක වියදමක් කර තිබුණි. |

## 1.9 අවිධිමත් ගනුදෙනු

අමාත්‍යාංශය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වු එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) 2012 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම තුළින් වෙන්කළ මුදල ඉක්මවා 2012 ඔක්තෝබර් 30 දින වන විට රු.4,050,302 ක භාණ්ඩ මිලදීගෙන තිබුණි.තවද මිලදී ගැනීම් කමිටු අනුමැතිය නොමැතිව රු.1,899,112 ක් වටිනා භාණ්ඩ මිලදී ගෙන තිබුණි.

(ආ) දැයට කිරුළ වැඩසටහන සඳහා රු.20,000,000 ක් වෙන්කර තිබියදී එම මුදල් සීමාව ඉක්මවා වෙනත් වැය ශීර්ෂ 05 කින් ඉන්ධන හා පවාහනය, සංයුක්ත දීමනා, සංග්‍රහ වියදම් සහ ජායාරූප මුද්‍රණය සඳහා රු.396,937 ක් වැය කර තිබුණි.

(ඇ) ජගත් පරිසර දනය සැමරීම සඳහා රු.5,500,000 ක ප්‍රතිපාදන සළසා තිබු අතර, ඉන් රු.2,983,102 ක් උපයෝජනය කර තිබුණි. එමගින් පුවත්පත් ප්‍රචාරණ දැන්වීම් සඳහා රු.1,925,520 ක් හෙවත් සියයට 65 ක් වැයකර තිබුණි. ප්‍රධාන කාර්යයන් 03 ක් වන බිංගිරිය නව නගරය පියකරු පුරවරයක් ලෙස සංවර්ධනය කිරීම, ජාතික පාසැල් සංවර්ධන කටයුතු හා රුක් රෝපන කටයුතු යනාදිය සඳහා රු.4,250,000 ක ප්‍රතිපාදන ලබාදී තිබුණත්, එම කටයුතු ඉටුකර නොතිබුණි. තවද පරිසර දිනයට සමගාමීව බ්‍රසීලයේ පැවති (Rio + 20) වැඩසටහන සඳහා වෙනත් වැය විෂයයන් 04 කින් රු. මිලියන 1.067 ක් ගුවන් ගමන් බලපත්‍ර ගැනීම, මාධ්‍යවේදීන්ට Pen Drives 80 ක් මිලට ගැනීම හා සමරු කවර සහ පුද්ගල කාරක මුද්දර මිලදී ගැනීම සඳහා වැයකර තිබුණි.

(ඈ) වායුතත්ත්ව පසු විපරම් මධ්‍යස්ථාන 04 ක් මිලදී ගැනිම සඳහා රු.120,000,000 ක් භාණ්ඩාගාර ප්‍රතිපාදන සළසා තිබුණද, එම මිලදි ගැනීම් කර නොතිබුණි. ඒ හේතුකොටගෙන පරිසරයේ වායු තත්ත්වය අධීක්ෂණය කිරීමේ කටයුතු අඩපණව පැවතුණි.

## 1.10 කළමනාකරණ දුර්වලතා

අමාත්‍යාංශයට අදාලව විගණකාධිපති වාර්තාවල ඇතළත්ව තිබුණු විගණන ජේද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පරීක්ෂා කිරීමෙන් අනතුරුව පසුවිපරම් කටයුතු නිම නොවූ ජේද පිළිබඳ විස්තර පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය | රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේ දිනය | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| වර්ෂය | ජේද අංකය | | | |
| 2008 | 7 (ඇ) | මෙහෙයුම් අකාර්යක්ෂමතා 2005 හා 2006 වර්ෂවල ක්‍රියාත්මක වූ ගෝලීය පාරිසරික කළමනාකරණ ව්‍යාපෘතියේ අවිධිමත් කරුණු සම්බන්ධ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාවක් ලබාදීම. | 2013.03.06 | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂණ කොමිෂන් සභාවෙන් මේ පිළිබඳ කරුණු විමසා අවශ්‍ය චෝදනා පත්‍රය කඩිනමින් ඉදිරිපත් කර නොතිබුණි. |
| 2008 | 5(ඇ) | බාහර පාර්ශවයන් වෙත දී ඇති වත්කම් සෙපිරෝ කාර් රථය හා ටොයෝටා කැබ් රථය. | 2013.03.06 | අදාළ ඇමතිවරයා දැනුවත් කිරීම. එම වාහන ආපසු ලබා ගැනීමට හෝ පවරා දීමට කටයුතු කර නොතිබුණි. |
| 2008 | 4.2 (ආ) | හිඟ ණය ශේෂ නොපියවූ විදේශ ගමන් අත්තිකාරම් රු.260,361. | 2013.03.06 | නීතිපති උපදෙස් කඩිනමින් ලබාගෙන ණය මුදලට ඇප වශයෙන් තබා ඇති ඉඩම විකුණා ණය මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| 2011 | 4.3 (අ) | අග්‍රිම ගිණුම් | 2013.03.06 | අත්තිකාරම් මුදල ලබාගත් ඇමතිවරයාගේ පෞද්ගලික ලේකම් වෙත එම මුදල පියවන ලෙස දැන්වීමට හා පියවා ගැනීමට කටයුතු කිරීම හා ඒ පිළිබඳ අදාළ ඇමතිවරයා දැනුවත් කර නොතිබුණි. |
| 2011 | 5(ඇ) | වෙනත් ආයතන සතු වත්කම්. | 2013.03.06 | අදාළ වාහන පවරා ගැනීම හෝ පවරා දීමට කඩිනමින් කටයුතු කර නොතිබුණි. |

## 1.11 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2012 දෙසැම්බර් 31 දිනට වු සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (අ) ජ්‍යෙෂ්ඨ මට්ටම | 45 | 27 | 18 | - |
| (ආ) තෘතියික මට්ටම | 37 | 36 | 01 | - |
| (ඇ) ද්විතියක මට්ටම | 124 | 81 | 43 | - |
| (ඈ) ප්‍රාථමික මට්ටම | 76 | 54 | 22 | - |
| (ඉ) වෙනත් (අනියම් / තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 01 | 10 | - | 09 |
| එකතුව | 283 | 208 | 84 | 09 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 84 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි.

(ii) මීට අමතරව උපාධිධාරී අභ්‍යාසලාභී වැඩ සටහන යටතේ බඳවා ගත් උපාධිධාරී අභ්‍යාසලාභී නිලධාරීන් 51 දෙනෙකු ද අමාත්‍යාංශයේ සේවයට අනුයුක්ත කර තිබුණි.

**2. විසර්ජන ශීර්ෂය 283 - වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව**

**2.1 විගණන විෂය පථය**

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා ආදායම් ගිණුම් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුකම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2012 අගෝස්තු 23 දින වන විට වන සංරක්ෂණ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**2.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම**

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සාමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2.3 විගණන නිරීක්ෂණ

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන, මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ 2.4 සිට 2.10 දක්වා වූ ඡේදවල ඇතුළත් වෙනත් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) අයවැය විචලනය

වැය විෂයයන් 7 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10 ත් සියයට 63 ත් අතර පරාසයක පැවතුණි.

### (ආ) පොදු තැන්පත් ගිණුම

2012 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ගිණුමේ ශේෂය රු.12,282,619 ක් විය. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

(i) ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පුහුණුකිරීමේ ශ්‍රේණියේ අඩවි වන නිලධාරි (දෙමළ මාධ්‍ය) ට බඳවා ගැනීම් විභාගය සඳහා අයදුම්කරුවන් 67 දෙනෙකු අයදුම්පත් ඉදිරිපත් කර තිබුණි. ඒ සඳහා විභාග ගාස්තු වශයෙන් එක් අයදුම්කරුවකු රු.300 ක් බැගින් පොදු තැනපත් ගිණුමට බැර විය යුතු උපරිම මුදල රු. 20,100 ක් වුවත් 2010 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා එම විභාග ගාස්තු වශයෙන් රු.29,400 ක් පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ii) ඉහත තැන්පත්වලට අමතර වශයෙන් විභාගය කුමක්ද යන්න පැහැදිලිව සටහන් කර නොමැති විභාග ගාස්තු වශයෙන් රු.4,800 ක ද පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

### (ඇ) ආදායම් ගිණුම

#### (i) ආදායම් සංකේතය : 2002:01:02 රජයේ කැලෑ වලින් ලැබෙන ආදායම

- **ඇස්තමේන්තුගත ආදායම සහ තථ්‍ය ආදායම**

ඉකුත් වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම රු. 840,000,000 ක් වූ අතර ශුද්ධ ආදායම රු.1,399,283,630 ක් විය. එය ඇස්තමේන්තුගත ආදායමට වඩා සියයට 67 කින් වැඩි වී තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම රු.875,000,000 ක් ලෙස ඇස්තමේන්තු කර තිබුණු අතර ශුද්ධ ආදායම රු.758,415,568 ක් විය. ඒ අනුව ඇස්තමේන්තුගත ආදායමට වඩා

සියයට 13 කින් පමණ ආදායම අඩුවී තිබුණි. එය ඉකුත් වර්ෂයේ ශුද්ධ ආදායමට වඩා සියයට 46 කින් පමණ අඩුවී තිබුණි.

- **හිඟ ආදායම**

ගිණුම අනුව සමාලෝචිත වර්ෂය අවසානයට මුළු හිඟ ආදායම රු. 765,450,575 ක් ලෙස දක්වා තිබුණු අතර එම හිඟ ආදායමින් රු. 96,314,276 ක් එනම් සියයට 13 ක් පමණ සමාලෝචිත වර්ෂය තුළදී කපා හැර තිබුණි. සමාලොචිත වර්ෂය තුළදී හිඟ හිටි ආදායමෙන් සියයට 14 ක ලැබී තිබු අතර වර්ෂය අවසානයට රු. 563,427,145 ක තවදුරටත් ලැබිය යුතුව තිබුණි. රාජ්‍ය දැව සංස්ථාවෙන් ස්කන්ධභාග ලෙස රු. 560,288,680 ක ද මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් සහ පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් පිළිවෙලින් රු. 1,227,000 ක හා රු. 1,860,400 ක ද එම හිඟ හිටි ආදායමෙහි ඇතුළත්ව තිබුණි.

- **ස්කන්ධභාග මුදල් අයකර ගැනීම**

රාජ්‍ය දැව සංස්ථාවෙන් දෙපාර්තමේන්තුව වෙත ලැබිය යුතු ස්කන්ධභාග මුදල් සහ රාජ්‍ය දැව සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන වල වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට ගෙවියයුතු ස්කන්ධභාග මුදල් අතර පහත සඳහන් පරිදි රු. 82,717,357 ක වෙනසක් අනාවරණය වු අතර එය නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

| | රාජ්‍ය දැව සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන අනුව | වන සංරක්ෂණ දෙපාර්තමේන්තු පොත් අනුව |
|---|---|---|
| | රු. | රු. |
| ආරම්භක ශේෂය ( 2012.01.01 දිනට) | 142,217,074 | 252,902,701 |
| භාණ්ඩාගාර අනුමැතිය මත ලියාහැරීම් | 96,314,276 | 96,314,276 |
| | 45,902,798 | 156,588,425 |
| 2012 වර්ෂයට අදාල ස්කන්ධභාග මුදල් | 861,372,664 | 919,409,410 |
| | 907,275,462 | 1,075,997,835 |
| 2012.12.31 දිනට ශේෂය | 474,283,658 | 560,288,674 |
| වර්ෂය තුළ ගෙවු මුදල / ලැබු මුදල | 432,991,804 | 515,709,161 |
| වෙනස | | 82,717,357 |

**(ii) ආදායම් සංකේත 10:03:07:3 - පෞද්ගලික දැව ප්‍රවාහනය**

- **ඇස්තමේන්තුගත ආදායම සහ තථ්‍ය ආදායම**

සමාලෝචිත වර්ෂයේදී ඇස්තමේන්තුගත ආදායම රු. 150,000,000 ක් වූ අතර ශුද්ධ ආදායම රු. 59,386,598 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී ඇස්තමේන්තගත ආදායමෙන් සියයට 40 ක් පමණක් ලැබී තිබූ අතර ඉකුත් වර්ෂයේදී එය සියයට 41ක් වී තිබුණි. ඒ අනුව ඇස්තමේන්තුගත ආදායම සහ තථ්‍ය ආදායම අතර විශාල වෙනසක් නිසා ඇස්තමේන්ත සකස් කිරීමේදී මු.රෙ. 128 (2) (අ) විධිවිධාන පිළිපැද නොතිබුණි.

- **හිඟ ආදායම් වාර්තා**

මු.රෙ. 176 (1) අනුව ආදායම් ගණන්දීමේ නිලධාරියා විසින් මු.රෙ. 128(2) ප්‍රකාර හිඟ රාජ්‍ය ආදායම් පිළිබඳ අර්ධ වාර්ෂික වාර්තා ජුලි 31 දින සහ ඊලඟ වර්ෂයේ ජනවාරි 31 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් එසේ ඉදිරිපත් කර නොතිබුණි. හිඟ ආදායම් සමන්විත වී ඇති ආකාරය දැක්වෙන හිඟ ආදායම් ලේඛනයක් ද පිළියෙල කර නොතිබුණි.

(ඇ) **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 28301 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2012 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු. 10,639,829 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

## 2.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය

### 2.4.1 සංයුක්ත සැලැස්ම

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානින් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5/(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කළ යුතු වුවත්, එම සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 2.4.2 වාර්ෂික කාර්ය සාධන වාර්තා

ඉහත (2.4.1) හි සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ සඳහන් 2002 සැප්තැම්බර් 12 දින හා 2004 පෙබරවාරි 20 දින අංක 402 හා 402(1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව

දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කළ යුතු වාර්ෂික කාර්ය සාධන වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළයුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල කාර්ය සාධන වාර්තාව පාර්ලිමේන්තුවට 2013 ඔක්තෝබර් 07 දින ඉදිරිපත් කර තිබුණි.

**2.4.3 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව නියමිත දිනට වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණු අතර 2013 මාර්තු 14 දින එය පිළියෙල කර තිබුණි.

**2.4.4 අභ්‍යන්තර විගණනය**

අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා තිබුණත් එම ඒකකය සඳහා එක් නිලධාරියෙකු පමණක් සේවයේ යොදවා තිබුණි. ලංකාව පුරාම කලාප, දිස්ත්‍රික්, අඩවි වන කාර්යාල පිහිටුවා ඇති හා වාර්ෂිකව අයවැය ලේඛනය මගින් රු. 1,262,950,000 ක ප්‍රතිපාදන සලසා තිබුණු වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කටයුතු විගණනය සඳහා යොදවා ඇති අභ්‍යන්තර විගණන කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවන හෙයින් ඵලදායි අභ්‍යන්තර විගණනයක් සිදුවී නොතිබුණි.

## 2.5 වත්කම් කළමනාකරණය

**(අ) නිෂ්ක්‍රීය සහ ඌණ උපයෝජිත වත්කම්**

1997 වර්ෂයේ මායිම් නැවත නිරූපනය කිරීමේදී මහනුවර උඩවත්ත කැළේ රක්ෂිතයේ පර්චස් 90 ක ඉඩම් ප්‍රමාණයක් පෞද්ගලික හෝටල් සමාගමක් විසින් අනවසරයෙන් පරිහරණය කරන බව අනාවරණය විය. 2002 වර්ෂයේදී තක්සේරු දෙපාර්තමේන්තුව මගින් එම බිම් කොටස රු.11,750,000 කට තක්සේරු කර තිබුණි.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/සමීක්ෂණ මණ්ඩල/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මගින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2013 මාර්තු 31 දිනට ප්‍රථම සිදු කර එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණනයට 2013 ඔක්තෝබර් 25 දින ඉදිරිපත්කර තිබුණි.

## 2.6 අනුකූල නොවීම්

**නීති,රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

---------------------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **(අ) ආයතන සංග්‍රහය** | | |
| (i) xix පරිච්ඡේදයේ 5.2.1 වගන්තිය. | 122,291 | දෙපානම පිහිටි වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් ගොඩනැගිල්ලක වන සංරක්ෂක (පිරිස් හා පාලන) සහ ඔහුගේ පවුලේ අය 2011 මැයි 27 දින සිට පදිංචිව සිටින අතර, මේ සඳහා නිලධාරියාගේ වැටුපෙන් සියයට 12 ක නිවාස කුලී අයකර නොතිබණි. |
| (ii) xix පරිච්ඡේදයේ 5.8 වගන්තිය | 108,365 | ජලය හා විදුලිය සඳහා ගාස්තු පදිංචි නිලධාරියා විසින් ගෙවිය යුතු වුවත්, වන සංරක්ෂක (පිරිස් හා පාලන) පදිංචි නිවසේ 2011 මැයි 27 දන සිට නොවැම්බර් දක්වා එකතුව රු. 54,299 ක විදුලි ගාස්තුද එකතුව රු.54,066 ක් වූ ජල ගාස්තුවද කළුතර දිසා වන කාර්යාලය විසින් ගෙවා තිබුණි. |
| **(ආ) මුදල් රෙගුලාසි** | | |
| (i) මු.රෙ. 104 (1) | 9,406,899 | වාහන හා අනිකුත් පාඩුවක් හෝ අලාභ හානියක් සිදුවූ වහාම එහි ප්‍රමාණය හා හේතු නිශ්චිත වශයෙන් දැන ගැනීමත් එයට වගකිව යුත්තන් නිශ්චය කිරීම සඳහා වාර්තා පිළියෙල කළ යුතු වුවද, එම වාර්තා සකස්කර නොතිබුණි. |
| (ii) මු.රෙ. 325 | ගණනය කළ නොහැක | ප්‍රධාන කාර්යාලයේ අලෙවි මධ්‍යස්ථානයේ එකතු වන මුදල් පිළිබඳව කලින්කල කළයුතු හර වැරදි බැලීම් කිසිවක් මාණ්ඩලික නිලධාරියකු විසින් සිදුකොට නොතිබුණි. |

| | | |
|---|---|---|
| (iii) මු.රෙ. 754 හා 751 | ගණනය කළ නොහැක | පැල භාර ගැනීම හා නිකුත් කිරීම සඳහා බඩු ලේඛන පොත් භාවිතා කළ යුතු වුවත්, එවැනි බඩු ලේඛන පොත් හෝ එවැනි ආකෘතියක් භාවිතා කර තොග ලේඛන පවත්වාගෙන නොතිබුණි. |
| (iv) මු.රෙ. 756 | ගණනය කළ නොහැක | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය පැවැත්වීමේදී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතු පැල ගණන් ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. එම නිසා වර්ෂය අවසානයේ පැල ප්‍රමාණයන් පිළිබඳ තොරතුරු දෙපාර්තමේන්තුව සතු නොවීය. |

**2.7 කාර්ය සාධනය**

**ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්**

දෙපාර්තමේන්තුව ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටු නොකර තිබුණු අතර, එසේ නිරීක්ෂණය වූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

**පෞද්ගලික අංශයේ සහභාගිත්වයෙන් වන වගා කිරීම**

(අ) සීග්‍රයෙන් අඩුවීගෙන යන ශ්‍රී ලංකාවේ වනාන්තර ප්‍රමාණය වැඩි කර ගැනීමේ අරමුණින් දෙපාර්තමේන්තුව සතු ලදු කැලෑ සහ මුඩු ඉඩම් වන වගා සඳහා පෞද්ගලික අංශය වෙත වසර 30 ක කාලයක් සඳහා බදු දීම 2000 වර්ෂයේදී ආරම්භ කර තිබුණි. ව්‍යාපෘතියේ I අදියර ආරම්භකොට වසර 11 කදී මුළු ගිවිසුම් ගණන 54 සිට 14 දක්වා අඩු වී තිබුණු අතර පෞද්ගලික අංශය විසින් නඩත්තු කරන බිම් ප්‍රමාණය හෙක්ටයාර් 506 සිට හෙක්ටයාර 137 දක්වා අඩු වී තිබුණි. එය වගාකළ මුළු ඉඩම් ප්‍රමාණයෙන් සියයට 27 ක් වී තිබුණි.

(ආ) 2002 වර්ෂයේදී ආරම්භ කරන ලද ව්‍යාපෘතියේ II වන අදියර ආරම්භයේදී ඇති කර ගත් ගිවිසුම් 32 න් වර්ෂ 08 කට පසු ක්‍රියාකාර මට්ටමේ ගිවිසුම් 09 ක් පැවතුණු අතර, වගාකළ හෙක්ටයාර් 511 න් වර්තමානයේ නඩත්තු කරන හෙක්ටයාර් ප්‍රමාණය 311 දක්වා අඩු වී තිබුණි. එය වගා කළ මුළු ඉඩම් ප්‍රමාණයෙන් සියයට 61 ක් විය.

(ඇ) සමස්ථයක් වශයෙන් ගත් කළ මුළු ව්‍යාපෘතියෙන්ම වගාව ආරම්භ කළ හෙක්ටයාර් 1,017 ක ප්‍රමාණයෙන් වර්තමානය වන විට පෞද්ගලික අංශය හෙක්ටයාර් 448 ක් නඩත්තු කරනු ලැබේ.

(ඈ) පෞද්ගලික අංශයේ සහභාගිත්වයෙන් සිදුකළ වන වගා කිරීමේ ව්‍යාපෘතිය අසාර්ථක වී තිබුණි. වගාවන් අත්හරින ලද ඉඩම් ප්‍රමාණය නිසියාකාරව නඩත්තු කිරීම සම්බන්ධයෙන් හා 2012 දෙසැම්බර් 31 වන දින වන විටත් පෞද්ගලික අංශය නඩත්තු කරගෙන යනු ලබන සීමිත ඉඩම් ප්‍රමාණය ඉදිරි වසර 20 ක කාලය තුළදී ක්‍රමවත්ව නඩත්තු කිරීම සම්බන්ධයෙන් විධිමත් වැඩපිළිවෙලක් සකස්කර නොතිබුණි.

**2.8 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

---

අම්පාර දිසාවේ හා අඩවියේ කලුගල් කැඩීම සඳහා පුද්ගලයන්හට අවසර ලබාදීමේදී අයදුම්කරුවන් සමඟ ගිවිසුමකට එළඹ තිබු අතර, එකී ගිවිසුමේ සඳහන් කොන්දේසි උල්ලංඝණය වන අයුරින් කටයුතු කර තිබුණි.

**2.9 කළමනාකරණ දුර්වලතා**

---

පහත සඳහන් දුර්වලතාවයන් නිරීක්ෂණය විය.

**(අ) විසඳා නොතිබුණු විගණන ජේද**

---

දෙපාර්තමේන්තුවට අදාලව විගණකාධිපති වාර්තාවල ඇතුලත්ව තිබුණු විගණන ජේද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පරීක්ෂා කිරීමෙන් අනතුරුව පසු විපරම් කටයුතු නිම නොවු ජේද

විගණකාධිපති වාර්තාවට යොමුව

| වර්ෂය | ජේද අංකය | යොමුගත විෂයය |
|---|---|---|
| 2008 | 4.3 (ආ) | රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුමේ ණය |
| 2009 | 4.3 (ii) | ශේෂ අයකර ගැනීමේ පසු විපරම් කටයුතුවල |
| 2010 | 1.3 (ඇ) (i) | දුර්වලතාවය |
| 2008 | 4.3 (ඇ) | රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුමේ |
| 2009 | 4.3 (i) | කෝවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව |
| 2010 | 1.3 (ඇ) (ii) | හා පාලන ගිණුමේ ශේෂය අතර වෙනස අවිනිශ්චිත ගිණුමකට මාරුකිරීම හා නිරවුල් නොකිරීම |
| 2010 | 1.7 (i) | රියදුරන් බඳවාගැනීමේ ප්‍රමාදය. |
| 2010 | 1.12 (ඊ) | ස්ථාවර වත්කම් ලේඛනය පිළියෙල කර නොතිබීම |

**(ආ) වන ව්‍යාප්ති වැඩසටහන යටතේ කොස් පැළ නිෂ්පාදනය**

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(i) 2012 වර්ෂයේ වන ව්‍යාප්ති වැඩසටහන යටතේ අමාත්‍යාංශයේ ප්‍රතිපාදන උපයෝගීකර ගනිමින් කොස් පැළ 250,000 ක් නිපදවා තිබූ අතර ඉන් පැළ 129,215 ක් හෙවත් නිෂ්පාදිත පැළ ප්‍රමාණය සියයට 52 ක් 2013 අප්‍රේල් 03 දින වන විටත් ඉතිරිව පැවතුණි.

(ii) වන සතුන්ගෙන් ඇතිවන හානි නිසා කොස්පැළ වන ශාඛයක් මෙන් වන ව්‍යාප්ති කටයුතු සඳහා භාවිතා කළ නොහැකි අතර, එම පැළ මහජනයා අතර ගෘහස්ථ බෝගයක් ලෙස වගා කිරීම සඳහා බෙදාහැරීමට සැලැස්මක් සකස් කර නොතිබුණි.

(iii) මෙම පැළ මඩ් ගතකොට වර්ෂයකට ආසන්න කාලයක් වීම නිසා එම පැළ විශාල වෙමින් වැඩෙන අතර එම පැළ නඩත්තුව ඉතාම දුෂ්කර කාර්යයක් වී තිබුණි.

(ඇ) විවිධ ආයතන / පුද්ගලයන් විසින් ක්‍රියාත්මක කරනු ලබන වන වගා වැඩසටහන් සඳහා අවශ්‍ය වන විවිධ වර්ගයේ පැළ 5,000 කට වඩා වැඩි ප්‍රමාණයක් වන සංරකෂණ දෙපාර්තමේන්තුවේ පැළ තවාන්වල එම වන පැළ නිපදවා පැළ අපේක්ෂා කරන වගාකරුවන්ට පැළ බෙදාදීමේ වැඩසටහනක් 2011 වර්ෂයේදී ආරම්භ කර තිබුණද එයද අසාර්ථක වී තිබුණි.

(ඈ) වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව නිෂ්පාදනය කරන පැළ වර්ග අලෙවියෙන් 2010,2011 හා 2012 වර්ෂවල පිළිවෙලින් රු.7,092,121 රු. 6,097,292 හා රු.6,934,353 ක සැලකිය යුතු ආදායමක් ලැබුණද, පැළ අලෙවිය පිළිබඳ විධිමත් පරිපාටියක් වන සංරක්ෂක ජනරාල් වරයා විසින් හඳුන්වා දී නොතිබුණි.

(ඉ) වන ව්‍යාප්ති වැඩසටහන් අතර පාසැල්වලට සහ රජයේ ආයතනවලට නොමිලේ පැළ ලබාදීමට වැඩි සැලකිල්ලක් දක්වා තිබු අතර, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට සෘජුවම කළහැකි මාර්ග දෙපස රුක් රෝපණය කිරීම ගං ඉවුරුවල හා ජලාධාරවල රුක් රෝපණය කිරීම පිළිබඳව අඩු සැලකිල්ලක් දක්වා තිබුණි.

(ඊ) ප්‍රධාන කාර්යාලයේ පැළ හා ප්‍රකාශන අලෙවි මධ්‍යස්ථානය පරීක්ෂාවේදී එහි මුදල් එකතු කිරීම, පැළ තොග ලේඛන නඩත්තු කිරීම විධිමත්ව සිදුවී නොතිබුණි. තවද අලෙවි වටිනාකම සහිත ප්‍රකාශණ ලේඛනගතව නොතිබු අතර, අභ්‍යන්තර පාලන පද්ධතියේ පවතින දුර්වලතාවයන් හේතුකොට ගෙන මූල්‍ය අක්‍රමිකතාවන් සිදුවීමටද ඉඩකඩ පැවතුණි.

(උ) **බගවන්තලාව වැපල්ටන් වාණිජ තුනී කිරීමේ බිම් කට්ටියේ අනවසර හෙළීම්**

2010 වර්ෂයේදී රාජ්‍ය දැව සංස්ථාව වෙත නිදහස් කරන ලද නුවරඑළිය දිසාවේ හෙක්ටයාර් 10 ක ග්‍රාන්ඩිස් වන වගාවෙහි වාණිජ තුනී කිරීමේදී ගස් 505 ක වංචනික ලෙස හෙලීම තුළින් රු. 32,642,148 ක් සහ විශාල ගස් 30 ක් විනාශ කිරීම නිසා රු. 872,395 ක අලාභයක් රජයට සිදු වී ඇති බව නුවරඑළිය දිසා වන නිලධාරීවරයාගේ පරීක්ෂණයෙන් අනාවරණය වී තිබුණි. එම අක්‍රමිකතාවය සිදුවී 2013 ජුනි 21 දනට මාස 18 කට වැඩි කාලයක් ගත වී තිබුණත් එම වන අපරාධය පිළිබඳව මූලික විමර්ශනයක් සිදු කිරීම සඳහා වන සංරක්ෂක ජනරාල්වරයා විසින් සහකාර වන සංරක්ෂක සහ වන පාලකවරයෙක් 2012 අප්‍රේල් 25 දින පත්කර මාසයක් ඇතුළත වාර්තාවක් ලබාදෙන ලෙස දන්වා තිබුණි. විමර්ශන වාර්තාව 2013 අගෝස්තු 01 දන වන විටත් වන සංරක්ෂක ජනරාල්වරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ඌ) **නකල්ස් සංරක්ෂණ මධ්‍යස්ථානයේ ඉදි කිරීම් කටයුතු**

**සේර ඇල්ල ආශ්‍රිත ඉදිකිරීම් කටයුතු**

නකල්ස් සංරක්ෂණ මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු සඳහා රු.11,797,532කට කොන්ත්‍රාත් පිරිනමා තිබුණු අතර ඉදිකිරීම් නිසි ප්‍රමිතයට සිදුකර නොතිබුණි.

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය වන සංරක්ෂක (පරිසර කළමනාකරණ) විසින් ඔහුගේ 2009 සැප්තැම්බර් 16 දිනැති EMD/ECO/Dev/knck/2009 දරන ලිපිය මඟින් ඉදිකිරීම් අධීක්ෂණය සඳහා සුදුසුකම්ලත් රජයේ තාක්ෂණික නිලධාරියකුගේ සේවය ලබා ගත යුතු බව මාතලේ දිසා වන නිලධාරී වෙත දන්වා තිබුණත් එවැනි තාක්ෂණික නිලධාරියකුගේ සේවය ලබා ගෙන තිබුණු බවට සාක්ෂි ඉදිරිපත් නොවීය.

එකතුව රු. 692,871 ක වටිනා වියදම් වෙනුවෙන් ගෙවීම් වවුචර් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(එ) **වෙනත්**

(i) වන සංරක්ෂක (පිරිස් හා පාලන) ත්‍රිකුණාමලය අතිරේක දිසාපතිවරයා ලෙස කටයුතු කළ කාලයේදී නීතිවිරෝධී ලෙස රජයේ වාහනයක් ධාවනය කර අනතුරකට භාජනය කර තිබුණි. එම වාහනයට රු. 484,252 ක අලාභ හානියක් සිදුකළ නිලධාරියාගෙන් එම අලාභය අය කිරීමට තීරණය කර තිබුණද,නිලධාරියා විසින් එම ගෙවීම් පැහැර හැර තිබුණි. එම නිලධාරියාට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ii) 2008 ජුනි 26 දිනැති අංක 14/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ නියමයන් පරිදි මාසිකව රු.30,000ක ප්‍රවාහන දීමනාවක් හා රු.20,865ක ඉන්ධන දීමනාවක් ලබාගන්නා වන සංරක්ෂක (පිරිස් හා පාලන) විසින් දෙපාර්තමේන්තුවේ වාහනයක්ද නීතියට පටහැනිව පාවිච්චි කර තිබුණි.

## 2.10 මානව සම්පත් කළමනාකරණය

(අ) **අනුමත සේවක සංඛ්‍යාව සහ පුරප්පාඩු**

2012 දෙසැම්බර් 31 දිනට සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨ මට්ටම | 84 | 48 | 36 |
| (ii) තෘතීයික මට්ටම | 42 | 31 | 11 |

| | | | |
|---|---|---|---|
| (iii) ද්විතියක මට්ටම | 1383 | 960 | 423 |
| (iv) ප්‍රාථමික මට්ටම | 1609 | 1218 | 391 |
| **එකතුව** | 3118 | 2257 | 861 |

පහත සඳහන් නිරීක්ෂණයක් කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පැවති පුරප්පාඩු 861 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි.

**(ආ) අවිධිමත් ලෙස වෙනත් පාර්ශවයන්ට නිදහස් කළ මානව සම්පත්**

දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේදී වෙනත් පාර්ශවයන්ට අවිධිමත් ලෙස මුදාහැර තිබුණු මානව සම්පත් පිළිබඳ විස්තරයක් පහත දැක්වේ.

| සේවක වර්ගය | සේවක සංඛ්‍යාව | මානව සම්පත් ලබාදී ඇති පාර්ශවය | මුදාහැර තිබුණු කාලපරිච්ඡේදය |
|---|---|---|---|
| (i) බීට්ටු වන නිලධාරි | 01 | පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය | 2008.01.01 දින සිට වාර්තාවේ දින දක්වා |
| (ii) වන ක්ෂේත්‍ර සහකාර | 03 | පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය | 2008.01.01 දින සිට වාර්තාවේ දින දක්වා |